# 7

# අනුරාධපුරයේ, ජේතවන ක්ෂේත්‍රයෙන් වාර්තා වී ඇති පබළු නිර්මාණ හා ඒ ඇසුරෙන් සිදු කෙරෙන මූලික වර්ගීකරණය

ඩී. තුසිත මැන්ඩිස්

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පබළු නිර්මාණයේ අතීතය පිළිබඳ ව විමසා බැලීමේ දී එය ප්‍රාග් ඓතිහාසික මධ්‍යය ශිලා අවධියේ සිට ආරම්භ ව ඇති බව පෙනේ. සිරාන් දැරණියගල පෙන්වා දී ඇති ආකාරයට අධීන් අවුරුදු 18,500ත් 16,500ත් අතර කාලයේ දී කුරුට බටදොඹ ලෙන තුළින් මුහුදු බෙලි කටුවලින් කළ පබළු හමු වී තිබේ (Deraniyagala 2007:53).මින් පසු ව මූල ඓතිහාසික සංස්කෘතික අවධියේ දී ඛනිජ පාෂාණ හා ලෝහ වලින් නිර්මාණය කළ පබළු හමු වී තිබේ (Seneviratne 1984:237-305). මේ ආකාරයට ඇරඹි ශ්‍රී ලංකාවේ පබළු නිර්මාණය මුල් ඓතිහාසික හා මධ්‍යය ඉතිහාසය තුළ බහුල ලෙස වර්ධනයට පත් වී ඇත. විශේෂයෙන් මධ්‍යය ඉතිහාසයේ දී ඇරඹෙන මහා විහාර ආශ්‍රිත ව ද බහුල ලෙස පබළු හමු වී තිබෙන අතර ඒ අතරින් ජේතවන විහාරය ප්‍රමුඛ තැනක ලා සැලකිය හැකි ය. ජේතවන විහාරය ක්‍රිස්තු වර්ෂ 276-303 අතර කාලයේ ශ්‍රී ලංකාවේ රජ පැමිණි මහාසේන රජු ගේ නිර්මාණයක් ලෙස සැලකේ (*මව.* xxxvii :1-30, *නිස.*: 13, රත්නායක 1998:330). මෙම විහාරය ආශ්‍රිත ව මෙතෙක් සිදුකරන ලද පර්යේෂණ කැනීම් වල දී පබළු තුන්ලක්ෂ විසි දහසකට (320,000) වඩා වැඩි ප්‍රමාණයක් ලැබී තිබේ. මෙම පබළු ජේතවන (Jethavana period) හා ප්‍රාග් ජේතවන යුගය (Pre Jethavana period) ආශ්‍රිත ජනාවාස ස්තර වලින් වාර්තා වී තිබෙන අතර එහි දී විවිධ හැඩ සහිත පබළු රාශියක් හමු වී ඇත. එම පබළු ගොනුව ආශ්‍රය කර ගනිමින් මූලික වර්ගීකරණයක් සිදුකිරීම මෙම අධ්‍යයනයේ දී බලාපොරොත්තු වේ.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා පබළු වර්ගීකරණය සඳහා දැනට ලොව පිළිගත් පබළු වර්ගීකරණය සඳහා භාවිත කර තිබෙන ක්‍රමවේද වන බෙක් වර්ගීකරණ ක්‍රමවේදය (Beak Classification System) හා ඇනී දැරණියගල තිස්සමහාරාම පබළු වර්ගීකරණය සඳහා භාවිත කර ඇති ක්‍රමාවේදය (Anne Hammibal Deraniyagala Classification) පදනම් කර ගෙන ජේතවන ආංශුක ක්ෂේත්‍රය ආශ්‍රිත ව වාර්තා වී ඇති පබළු පිළිබඳ ව මෙම අධ්‍යයනය හා වර්ගීකරණය සිදුකර ඇත.

**විමර්ශනය**

ජේතවන විහාරය ඇසුරින් වාර්තා වී ඇති පබළු නිර්මාණය කිරීම සඳහා විවිධ අමුද්‍රව්‍යය භාවිත කර තිබේ. එම අමුද්‍රව්‍යය අතර දේශීය අමුද්‍රව්‍යය හා විදේශීය අමුද්‍රව්‍යය වර්ග රාශියක් තිබේ. දේශීය අමුද්‍රව්‍යය අතර විශේෂයෙන් ඛනිජ අමුද්‍රව්‍යය වන ඇමතෙස්ත, රබහ, විනිවිද පෙනෙන තිරුවානා, පෙබළු වර්ග ආදී ඛනිජ වර්ග රාශියක් උපයෝගී කරගෙන නිර්මාණය කරන ලද පබළු වර්ග හා විදේශීය ඛනිජ අමුද්‍රව්‍යය වන කානීලියන්, ඇගේට් ආදී ඛනිජ භාවිත තර නිර්මාණය කර ඇති පබළු වර්ග වන අතර ඛනිජ වලට අමතර ව විවිධ වර්ණ වීදුරු වර්ග ද ඇත් දළ හා සත්ත්ව දත් හා අස්ථි වර්ග මෙන් ම ලෝහ වර්ග ද පබළු තැනීම සඳහා භාවිත කර තිබේ (මැන්ඩිස් 2009:13-25). විශේෂයෙන් ම ජේතවන පබළු එකතු ව පිළිබඳ අධ්‍යයනයේ දී පැහැදිලි වන කාරණය වූයේ ඒවා නිර්මාණය කිරීම සඳහා තාක්ෂණික පියවර රාශියක් ද භාවිත කර තිබෙන බව ය. එම ක්‍රමවේද අතර වීදුරු පබළු තැනීම සඳහා **ඇදීමේ ක්‍රමය** (Drawn Techniqe) හා **එතීමේ ක්‍රමය** (Wound Technique) භාවිත කර තිබෙන අතර මෘදු ලෙස උණු කරන ලද වීදුරු මේ සඳහා භාවිත කර තිබෙන්නේ නළ ලෙස සකසා ගැනීමෙන් පසුව ය (මල්කාන්ති 2008:8-9). ඛනිජ පාෂාණ ආශ්‍රිත පබළු නිර්මාන සඳහා පීඩන ක්‍රමවේද (Fresher Techniques) හා ඒවා මෘදු කිරීම සඳහා මැදීමේ ක්‍රමවේද භාවිත කර තිබේ. එසේ ම සත්ත්ව අස්ථි හා දළ මෙන් ම දත් ආශ්‍රිත පබළු නිර්මාණය කිරීම සඳහා කැපීමේ ක්‍රමවේද (Cutting Techniques) හා හැඩ ගැන්වීමෙන් පසු මැදීම සඳහා ක්‍රමවේද භාවිත කර ඇත. මෙම ක්‍රමවේද භාවිත කර නිර්මාණය කර ඇති පබළු අතර අධ්‍යයනය තුළ දී පහත සඳහන් ප්‍රධාන හැඩවලින් යුත් පබළු වර්ග හඳුනාගත හැකි විය. ජ්‍යාමිතික හැඩ පබළු (Geometrical Shape), මල් හා ඵල හැඩ පබළු (Flower and seeds shape), සත්ත්ව රූප හැඩ පබළු (Animal Figer Shape) හා වෙනත් සංකේත පබළු (Symbolic beads) මෙම මූලික හැඩ හතරට අයත් පබළු අතර පහත සඳහන් ප්‍රධාන හැඩ 10 අයත් පබළු වර්ග වර්ගීකරණය තුළ දී හඳුනාගත හැකි විය.

i. රවුම් හැඩ පබළු (Circular Beads)
ii. පැති සහිත පබළු (Sides Beads)
iii. නැවුම් සහිත පබළු (Bend Beads)
iv. දෙපස කර සහිත පබළු (Lug collar Beads)
v. දෙපස කපන ලද කර සහිත පබළු (Croove collar beads)
vi. එක් කරක් සහිත පබළු(One collar Beads)
vii. සත්ත්ව රූප හැඩ පබළු(Animal Figer Beads)
viii. සංකේත නිරූපිත පබළු (Symbolic Beads)
ix. මල් හා ඵල හැඩ පබළු (Flower and seed Shaped Beads)
x . මාල පෙති හැඩති පබළු (Pendent Beads)

**I. රවුම් හැඩ පබළු (Circular beads)**

තිරස් හෝ සිරස් අතට රවුම් හැඩය ගන්නා පබළු මෙම වර්ගයට අයත් වේ. මෙම වර්ගයට අයත් උප හැඩයන් 18ක් ජේතවන පබළු අතරින් හඳුනාගත හැකි ය. හැනිබල් දැරණියගලගේ I වන වර්ගය වන Rounded beads, II වන වර්ගය වන Disk Beads, III වන වර්ගය වන Annular Beads හා IV වන වර්ගය Barrel Beads යන ප්‍රධාන වර්ග තුළ වන උප හැඩ 14ට අයත් වේ (Hannibal 2001:210). එසේ ම බෙක් පබළු වර්ගීකරණයේ රවුම් ආකාර පැතලි Disk Beads වර්ගයේ කාණ්ඩ අංක 01 (Group i Cerculer) පබළු හැඩ වලට සමාන ව ජේතවන I වර්ගය (Type I), රවුම් හැඩ පබළු (Circular beads) යන වර්ගය සමාන වන බව පෙන්වා දිය හැකි ය. ඒ අනුව මෙම වර්ග කිරීම් අනුව පහත සඳහන් උප වර්ගයන් ජේතවන පබළු එකතු ව ඇසුරින් හඳුනාගත හැකි ය.

**II. පැති සහිත පබළු (Sides Beads)**

පැති කිහිපයක් සහිත පබළු මේ යටතට අයත් වේ. මෙහි දී මෙම වර්ගවලට අදාළ උප වර්ග 18ක් ජේතවන පබළු ඇසුරෙන් හඳුනාගත හැකි අතර ඇනී දැරණියගලගේ ix (Faceted beads) වර්ගයේ පබළු හැඩ 4ට (Hanniel 2001:211) අයත් පබළු වර්ග ද මෙම වර්ගයට අයත් ව හඳුනාගත හැකි ය. බෙක් වර්ගීකරණය අනුව උප කොට්ඨාශ ii (Sub Divition ii) අයත් කාණ්ඩ (Group viii,x,xi,xii,xiii) ආදී පබළු හැඩ ජේතවන පබළු එකතුවේ හඳුනාගත හැකි අතර දැරණියගලගේ වර්ගීකරණයට අයත් නොවන නව උප වර්ග 14ක පැති සහිත පබළු ජේතවන පබළු එකතුව තුළින් හඳුනාගත හැකි ය.

**III. නැවුම් සහිත පබළු (Bend Beads)**

මෙම පබළුවල ප්‍රධාන ම ලක්ෂණය ලෙස නැවුමක් (Bend) දැකගත හැකි බැවින් නැවුම් සහිත පබළු ලෙස නම් කර ඇත. මෙම වර්ගයට අයත් ව විවිධාකාර නැවුම් සහිත ව නිර්මාණය කරන ලද පබළු රැසක් දක්නට ලැබේ. ඒවා රවුම්, දිගු හතරැස් හා උත්තල ආකාර හැඩ ගන්නා අතර උප වර්ග 11ක් ජේතවනය ඇසුරෙන් හඳුනාගත හැකි ය. ඇනී දැරණියගලගේ වර්ග අංක VIII (Cone beads) යන වර්ගයට අයත් ප්‍රධාන හැඩ තුනට (එම) අයත් පබළු වර්ග ද මෙම වර්ගයට අයත් ව ජේතවන පබළු එකතුවෙන් හඳුනාගත හැකි ය.මෙම නැවුම් සහිත පබළු තුළින් ෂඩස්‍රාකාර, පංචාස්‍රාකාර මෙන් ම චතුරස්‍රාකාර හැඩ සහිත පබළු ජේතවන පබළු එකතුව තුළින් හඳුනා ගත හැකි ය. බෙක් වර්ගීකරණය අනුව උප කාණ්ඩ ii අයත් xvi, xv වර්ග වලට අයත් පබළු ද ජේතවන පබළු එකතු ව තුළින් හඳුනාගත හැකි ය.

**IV. දෙපස කර සහිත පබළු (One Collar Beads)**

මෙම වර්ගයේ විශේෂත්වය වන්නේ පබලු ව නිර්මාණය කිරීමේ දී කර සහිත ව දෙපස හැඩ ගන්වා නිමවා තිබේ. ජේතවනය ආශ්‍රිත ව වාර්තා වී ඇති මෙම වර්ගයට අයත් පබළු උප වර්ග 14ක් හඳුනාගත හැකි ය. ඇනී දැරණියගලගේ වර්ගීකරණයට අයත් වර්ග අංක XI (Collar Beads) යන වර්ගයට අයත් Croove Collar වර්ගයේ හැඩ දෙකක් හා Lug – collar beads වර්ගයේ හැඩ 5ට එම අයත් වර්ග ද (එමː 212) මෙම වර්ගය තුළින් හඳුනාගත හැකි ය.බෙක් වර්ගීකරණයේ Longer Beads වර්ගයට අදාල ව මෙවැනි හැඩ පබලු හඳුනාගත හැකි ය.

**V. දෙපස කපන ලද කර සහිත පබළු (Croove collar beads)**

ජේතවන පබළු එකතුවේ දෙපස කපන ලද කර සහිත පබළු තිබේ. මෙම වර්ගයේ පබළුවල මූලික හැඩය සකස් කිරීමෙන් (වට හැඩය) අනතුරු ව කර සිටින සේ සකස් කර ඇත්තේ සීරීමට ලක්කිරීමෙන් හෝ කැපීමෙන් මෙම පබළුව නිෂ්පාදනය කර ඇත. මෙ වැනි හැඩ සහිත උප වර්ග 14ක් ජේතවනයෙන් හඳුනාගත හැකි ය. මෙම පබළු ඇනී දැරණියගලගේ Groove-collar Type 1හා 4 වර්ගවලට ද සමාන ව හඳුනාගත හැකි ය.

**VI. එක් කරක් සහිත පබළු (One collar beads)**

මෙහි විශේෂත්වය වන්නේ තනි කරක් සහිත ව පබළු ව නිර්මාණය කර තිබීමයි. එවැනි හැඩ සහිත උප වර්ග 6ක් ජේතවන පබළු එකතුවෙන් හඳුනාගත හැකි ය. මෙම වර්ගයේ පබළු සකස් කිරීමේ දී එහි කර සීරීමෙන් හෝ කැපිමෙන් නිර්මාණය කර තිබේ. ඇතැම් පබළු සඳහා කරක් වෙන ම අල්ලා නිර්මාණය කර තිබෙන

අතර ඇනී දැරනියගල ගේ Melon beads වර්ගයට සමාන පබළු ජේතවන පබළු එකතුවේ හඳුනාගත හැකි අතර එයට වෙනස් හැඩ ගණනාවක් ද පවතින බව පහත සඳහන් හැඩ අනුව පෙන්වාධිය හැකි ය.

### VII. සත්ත්ව රූප හැඩ පබළු (Animal figer Beads)

ජේතවනයෙන් හමු වූ පබළු එකතුව තුළ සත්ත්ව රූප හැඩ පබළු ද දැකගත හැකි ය. එමග පබළු තුළින් විවිධාකාරයේ සතුන් නිරූපණය කර තිබේ. එම සතුන් අතර ඉබ්බා, මාළුවා වැනි ජලජ ජීවීන් විශේෂයෙන් දැකගත හැකි ය. මෙ වැනි හැඩ සහිත පබළු ඇනි දැරණියගල ගේ තිස්සමහාරාම පබළු වර්ගීකරණය තුළ හා බෙක් වර්ගීකණය තුළ දැකගත නොහැකි ය. එ බැවින් මෙම සත්ත්ව රූප හැඩ පබළු උප වර්ග 9ක් ජේතවනයෙන් හඳුනාගත හැකි ය.

### VIII. සංකේත නිරූපිත පබළු (Symbolic Beads)

මෙම පබළු තුළ විවිධ ආකාරයේ සංකේත නිරූපනය කර තිබීම දැකගත හැකි ය. ඒ අතර පූර්ණ ඝටය හා විවිධ ජ්‍යාමිතික හැඩ වලට අයත් කැටයම් නිර්මාණය කර තිබේ. මෙම වර්ගයේ පබළු ජේතවනයෙන් ම පමණක් හමුවන විශේෂ පබළු වශයෙන් පෙන්වාධිය හැකි ය. මේ වර්ගයට අදාළ ව උප වර්ග 10ක් ජේතවන පබළු එකතුවෙන් හඳුනාගත හැකි ය. එම වර්ග 10ට අදාළ ව ඇති පබළු හැඩ ඇනී දැරණියගලගේ හෝ බෙක් වර්ගීකරණ සටහන තුළ හඳුනාගත නොහැකි ය. එ බැවින් මෙම වර්ගය ජේතවනයෙන් පමණක් හමුවන විශේෂ හැඩ සහිත වර්ගයක් වේ.

### IX. මල් හා ඵල හඩැති පබළු (Flower and Seeds shapes)

එක් පැත්තක මලක් ආකාරයෙන් ද අනෙක් පැත්තක ඵලයක ආකාරයෙන් පෙනෙන සේ නිර්මාණය කර ඇති පබළු මේ වර්ගයට අයත් ය. මෙ වැනි පබළු උප වර්ග 9ක් පමණ ජේතවනයෙන් හඳුනාගෙන තිබෙන අතර ඇනී දැරණියගලගේ වර්ගීකරණයේ හෝ බෙක් වර්ගීකරණයේ මෙ වැනි හැඩ සහිත පබළු හඳුනාගෙන නොමැත.

### X. මාල පෙති හැඩති පබළු (Pendent beads)

සිදුරක් විද මාල සඳහා යොදන මාල පෙති ආකාරයට නිමැ වූ පබළු උප වර්ග 2ක් ජේතවනයෙන් හමු වේ. මෙ වැනි හැඩ සහිත පබළු ඇනී දැරණියගලගේ පබළු වර්ගීකරණය තුළින් හෝ බෙක් වර්ගීකරණය තුළ දැකගත නොහැකි ය. එම නිසා මෙම පබළු වර්ගයට ජේතවනයෙන් හමුවන නවත ම පබළු වර්ගයක් වශයෙන් පෙන්වාධිය හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

*නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය* (1984), සංස්. *බන්දුසේන ගුණසේන*, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*මහාවංසය* (සිංහල) (1996), සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි; දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ, නුගේගොඩ, ගංගොඩවිල, සීමාසහිත දීපානි ප්‍රකාශන පෞද්ගලික සමාගම.

මල්කාන්ති, නාලනී, (2008), *පබළු නිර්මාණයේ අතීත විත්ති*, ජේතවනාරාම පුරාවිද්‍යා ග්‍රන්ථ මාලා අංක 03, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,

මැන්ඩිස්, තුසිත (2009), ජේතවන ස්තූප සලපතල මළුව හා වැලිමළුව ආශ්‍රිත පුරාවිද්‍යා පර්යේෂණ කැණීම් ඇසුරෙන් හෙළිවන පූර්ව ජනාවාස තොරතුරු, *ජේතවන ස්තූප පුරාණය* (සමරු කලාපය) සංස්.පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයඃ 13-25.

රත්නායක, හේම (1998), ජේතවන ස්තූපය හා ආරාම සංකීර්ණය, *අපේ සංස්කෘතික උරුමය* (ද්විතීය භාගය), කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, ආගමික කටයුතු අමාත්‍යාංශ

Beck, H.C. (1928), Classification and Nomenclature of Beads and pendants In *Archaeologia or Miscellaneous tr.acts relating to Antiquary*, Second series, Vol. 28, Oxford.

Daraniyagala, S.U. (2007), The PreHistory And ProtoHistory of Sri lanka, 1- 96, *The Art and Archaeology of Sri Lanka*, Centrel Cultural Fund,Ministry of Cultural Affairs.

Hammibal,A.S.D. (2001), Beads from Tissamaharama; A Typology of Sri Lankan Glass and semi - Precious stone Beads, *Ancient Ruhuna* vol.I, Sri Lankan-German Archaeological Project in southern province(eds) weisshar, H. J.,H. Rothi, W. Wijayapala: 203-294.

Seneviratne, S. (1984),The Archaeology of the Megalithic - Black and Red Ware Complex in Sri Lanka, *Ancient Ceylon* No.5: 237-305, Archaeology Survey Department, Sri Lanka.

# I. රවුම් හැඩ පබළු (Circular beads)



රවුම් ආකාර පැතලි

එම

එම

උත්තලාකාර පැතලි

අවතලාකාර පැතලි

උත්තලාකාර රවුම්

එම

ගෝලාකාර ඉලිප්ස

-

ගෝලාකාර

ගෝලාකාර ඉලිප්ස

උත්තලාකාර රවුම්

චතුරස්‍රාකාර රවුම්

සිලින්ඩරාකාර රවුම්

-

බැරල් ආකාර රවුම්

එම

එම

## II. පැති සහිත පබළු (Sides Beads)



ෂඩ්කොන් පැති සහිත නලා ආකාර

ෂඩ්කොන් පැති සහිත දෙපස උත්තලාකාර

දෙපස පැති සහිත අෂ්ටාස්‍රාකාර

ෂඩ්කොන් පැති සහිත නලාකාර

පංචාස්‍ර පැති සහිත නලාකාර

පංචාස්‍ර දෙපස පැති සහිතූ පීප්පාකාර

පංචාස්‍ර පීප්ප ආකාර

පංචාස්‍රාකාර නලාකාර

හතරැස් පීප්පාකාර

කුඩා හතරැස්

පංචාස්‍රකාර පැති සහිත නලාකාර

පංචාස්‍රාකාර පැති සහිත පීප්පාකාර

විශාල හතරැස්

දිගු හතරැස්

ඇතුළත සම සතරැස් දිගු ආකාර

අභ්‍යන්තරය හා පිටත හතරැස් ආකාර

පැතලි දිගු හතරැස් ආකාර

# III. නැවුම් සහිත පබළු (Bend Beads)




පංචාස්‍රාකාර

දෙපස කැපූ ෂඩස්‍රාකාර

පැති කැපූ පංචාස්‍රාකාර

පැති කැපූ හතරැස් ආකාර

දෙපස කැපූ ෂඩ්කොන් ආකාර

දෙපස කැපූ පැතලි ෂඩ්කොන් උත්තලාකාර

ෂඩ්කොන් උත්තලාකාර

දෙපස කැපූ ෂඩ්කොන් උත්තලාකාර

දෙපස කැපූ දිගු ෂඩ්කොන්

පැති කැපූ හතරැස් ආකාර

දෙපස කැපූ පෙති හැඩ උත්තලාකාර

## IV. දෙපස කර සහිත පබළු (One Collar Beads)



1. පීප්ප ආකාර රවුම්
2. ගෝලාකාර ඉලිප්ස
3. පැතලි පීප්පාකාර ඉලිප්ස
4. ගෝලාකාර අවතල
5. ගෝලාකාර උත්තල
6. ගෝලාකාර ඉලිප්ස
7. දෙපස නැවුම් සහිත ඉලිප්සාකාර
8. ගෝලාකාර ඉලිප්ස
9. කුඩා ගේලාකාර ඉලිප්ස
10. ගෝලාකාර රවුම්
11. ඉලිප්සාකාර රවුම්
12. ගෝලාකාර පැතලි
13. පැතලි හතරැස් ආකාර
14. පීප්පාකාර රවුම්

## V. දෙපස කපන ලද කර සහිත පබළු (Croove collar beads)




දෙපස කර සහිත ගෝලාකාර රවුම්

දෙපස කර සහිත පැතලි ආකාර රවුම්

දෙපස කර සහිත හතරැස් ආකාර

දෙපස කර සහිත රවුම් ඉලිපිස්කාර

දෙපස කර සහිත ගෝලාකාර

දෙපස කර සහිත රවුම් ඉලිප්සාකාර

දෙපස කර සහිත රවුම් බැරල් ආකාර

-දෙපස කර සහිත පැතලි ගෝලාකාර

දෙපස කර සහිත ද්වි ගෝලාකාර

දෙපස කර සහිත පැතලි රවුම් ආකාර

# VI. එක් කරක් සහිත පබළු (One collar beads)




කැකිරි/කොමඩු හැඩ

කැකිරි/කොමඩු හැඩ

\-

\-

කැකිරි/කොමඩු හැඩ

## VII. සත්ත්ව රූප හැඩ පබළු (Animal figer Beads)




ඉදිබුවෙකු ආකාර

ඉදිබුවෙකු ආකාර

ඉදිබුවෙකු ආකාර

ඉදිබුවෙකු ආකාර

මත්ස්‍යය ආකාර

මත්ස්‍යය ආකාර

මත්ස්‍යය ආකාර

මත්ස්‍යය ආකාර

# VIII. සංකේත නිරූපිත පබළු (Symbolic Beads)



## IX. මල් හා ඵල හැඩැති පබළු (Flower and Seeds shapes)



පෙති 5ක් සහිත මල හා ඵලය

පෙති 9ක් සහිත මල හා ඵලය

පෙති 6ක් සහිත මල හා ඵලය

-

-

-

## X. මාල පෙති හැඩති පබළු (Pendent beads)

